# සෙල්ලිපිවලින් හෙළිවන සමකාලීන සමාජ තත්ත්වය පිළිබඳ ව අධ්‍යයනයක් (අනුරාධපුර යුගය ඇසුරින්)

ඩී.ජී.එන්.කුලසේකර
ඉතිහාසය අධ්‍යයන අංශය
විශේෂවේදී දෙවන වසර
කැලණිය විශ්වවිද්‍යාලය
nalinikulasekara@gmail.com

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අගනුවර ලෙස සැලකෙන අනුරාධපුරය වූ කලී ඓතිහාසික අතින් වැදගත් අද්විතීය යුගයක් ලෙස හැඳින්විය හැකිය. රටක ඉතිහාසගත තොරතුරු අධ්‍යයනය කිරීමේ දී ඉතා වැදගත් පුරාවිද්‍යා මූලාශ්‍රයක් ලෙස සෙල්ලිපිවලට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. සෙල්ලිපි ප්‍රධාන වශයෙන් ලෙන් ලිපි, ගිරිලිපි, ටැම් ලිපි, පුවරු ලිපි වශයෙන් වර්ග කළ හැකිය. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ සෙල්ලිපිවලින් හෙළිවන අනුරාධපුර සමකාලීන සමාජය පිළිබඳව හැදෑරීමට හැකිවේ ද යන්න විමසා බැලීමයි. මේ සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය තෝරාගනු ලැබිණි.

අනුරාධපුර යුගයෙන් හමුවන සෙල්ලිපි සමකාලීන සමාජ තොරතුරු අනාවරණය කරගැනීමේ අරමුණින් රචනා වී නැතත් සෙල්ලිපි මඟින් සමකාලීන සමාජය තුළ පැවති සමාජ, හා සංස්කෘතික පසුබිම පිළිබඳ ව කුල ක්‍රමය, කාන්තාව, විවිධ ශ්‍රේණි, වෘත්තිකයින්, යනාදිය හැදෑරිය හැකි වේ. මෙම අධ්‍යයනයේ දී අභිලේඛන, වංසකතා සපයන දායකත්වයට වඩා වැඩි කරුණු ප්‍රමාණයක් සෙල්ලිපි මගින් උකහාගත හැකි වන අතර ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම මෙම අධ්‍යයනයෙන් තවදුරටත් සිදුකෙරේ. මේ අනුව මෙම අධ්‍යයනය තුළින් අනුරාධපුර යුගයේ සමකාලීන සමාජ තොරතුරු සෙල්ලිපි තුළින් විවරණය කරගත හැකි විය.

**ප්‍රමුඛ පද - අනුරාධපුර යුගය, සෙල්ලිපි, සමකාලීන සමාජය**